## අනිත් කොන
සායනික සටහන් ගොනුවේ



වෛද්‍ය බෝධිනී සමරතුංග

# ගිනිගත් වන්නි අහසට

**වන්නි මෙහෙයුමෙන් පසු හැර ගිය පෙම්වතා අවුරුදු 7 කින් නැවත පැමිණේ , එනමුත් ප්‍රේමය වියැකී ගොසිනි.**

මෛදලීයි මායි එකම වයසේ. ගිරව් දෙන්නාගේ කතාව මෛදලීට කීවේ මං. ඒකෙන් එයා එහෙම වෙන්නත් මම මෙහෙම වෙන්නත් හේතුව සමාජ පසුබිම කියලා එයා තේරුම් ගත්තා. වෛරය නැතිම කර ගත්තා. එයාට ඕනෙ වුනේ නිදහසේ ළුණු වවන්න. ඇයි ළුණු ම ඇහුවම.. අනිත්වත් වවන බව කීවා.

අපි සැරයක් යද්දි හිටියේ අර ලානිල් පාට ටෙන්ට් ගහගෙන එයාලගෙ ඉඩම්වල වගා කරමින්. ඒ කූඩාරම් ජීවිතේ ගෑනු ළමෙක්ට කිසිම ආරක්ෂාවක් නෑ කීවට එයා පිළිගත්තේ නෑ. අම්මා එක්ක එහෙමම හිටියා. මම කොළඹ ආවා. මුහුණු පොත සම්බන්දකම් වැඩි දියුණු කළා. හරියටම අවුරුදු හතකින් එයා එහෙම කියද්දී, **** කුලම ට ගිහින් අඬන්න ඕනේ කියා තව කෙනෙක් දුක් වෙනවා.

අපි වගේම මෛදලීත් දුක දමා ගැහුවේ වන්නි අහසට ... ගොඩක් දේවල් අහිමි වුන මැයි අග... අපේ කතා ලීවේ නැද්ද අහන ඒ සොඳුරු හිත මතක් වෙලා මෛදලී වෙනුවෙන් මේක ලීවා.

I met her during wanni days' She had a good insight about what was happening and always regretted her past' I had to tell her a story from jathaka kathaa" where two parrot brothers end up in two different societies when socia norms stressors and situations shape up and sharpens one~s life into its current state' She loved that i was different from a typical doctor mainly because I was young' I remember seeing her land and the light blue tent she lived in the beggining of resettlements'

**හිත දරා පිපුණා**
**ගැබ්බර සෙනෙහෙ මල් මිට**
**නුඹ තලා උදුරා**
**ගබ්සා කළා ප්‍රේමය**
**මගෙ කියා කිසිවෙක්**
**ඉතිරි නොවනා මැයි අග**
**දුක දමා ගැහුවේ**
**ගිනිගත් වන්නි අහසට**

**ඉරිතැලුණු හදවත්**
**පණ බුදින පිපිරුම් මැද**
**ඉතින් අපි ඉවරයි**
**නැගෙන සැමරුම් ලද**
**වෛර නැගෙන මායිම්**
**එපිට පැන තල් වැට**
**දුක ඉතින් කීවේ**
**ගිනිගත් වන්නි අහසට**

**මල් දරා පිපුනා,**
**තහනම් කෙරුණු ගස්වල**
**ඒ තලා කොනිතා**
**උගුළා දැමූ හිස් කුස**
**නුඹ නමින් පුදින**
**කඳුළක් නේව් කිසි දින**
**සාප දෙස් තිබ්බෙම**
**ගිනි ගත් වන්නි අහසට**

**එදා උන් මම නොව**
**වෙනත් කෙනෙකුන් නොව**
**දරාගත්තම පෙම**
**ගලක් වෙනවලු හිත**
**නේන තරමට හොඳ**
**හෙටක් හිමි නැති කය**
**දිනෙක මුදනෙම් මමත්**
**ගිනිගත් වන්නි අහසට**



## වනබිම සැරිසර





නිමල් සේදර

# මතකය පසුපස දුවන අලි

අලියා ඇතා ඉතා හොඳ මතකයක් තියෙන සතෙක් ලෙස හඳුන්වන ලැබේ. ඒ මතකය පිළිබදව අපේ ඉතිහාසයෙන් විවිධ රසවත් කතා සොයා ගැනීමට පුළුවන් කම තිබේ. තමාට හිරිහැර කළ තැනැත්තෙකුට පහරදීම සඳහා කඩොල් ඇතා බොහෝ කලක් පොල් ගෙඩියක් හක්කේ තබා ගැනීමේ පුවතක් මහාවංශයේ සඳහන්ව ඇත.

අප මව කුඩා අවදියේ ජීවත්වූ ගම් පෙදෙසේ කඩපිල මැදින් නිතර කුරුඳුඔයේ දියනෑමට ගෙන ගිය අලියෙක් කළ හදියක් ද මේ කරුණු සනාථ කරයි.

මේ අලියා දියනෑමෙන් පසු කඩපල හරහා යද්දී තැන තැන නතර වී කඩපිලවලින් දෙනු ලබන කෙසෙල් ගෙඩි බනිස් වැනි පැනි රස කෑමට පුරුදුව සිටියේය. එක් කඩපිලක මැෂිමක් තබාගෙන ඇදුම් මසන ටේලර් කෙනෙක්ද මේ අතර විය. දිනක් අලියා ඔහු සිටි කඩපිලට ආහාර පතා හොඬය දිගු කළවිට මේ සන්නාලිය අතේ තිබුණු ඉදිකටුවෙන් හොඬයට ඇන්නේය. අලියා කලබලයකින් තොරව යන්නට ගියේය. සන්නාලිය වීරයා සේ සිනාසුනේය. අලියා සිරිත් පරිදි නගරය මැදින් දිනපතා දියනෑමට ගියේය. සතියක් පමණ මෙසේ ගත වන්නට විය. අලියා දිය නාගෙන පැමිණෙන අතර හැරිහැර කළ සන්නාලිය අසල නතරවිය.

හොඬය එසෙව්වේය. හඬ නැගුවේය. අමු මඩ සහිත ජල ධාරාවක් සන්නාලියගේ මුහුණටත් ඔහු අවට එල්ලා තිබුණු ඇඳුම්වලටත් නිමේෂයකින් එල්ල විය. පලියට පලි ගත් අලියා පියවර මැන්නේය.

මැදිරිගිරයේ විජයපුර ඉහළ ගම්මානයේ ගලදමන නැමැති ප්‍රදේශයේ සිදුවූ එක්තරා ත්‍රාස ජනක සිද්ධයකින්ද සනාථ කෙරෙන්නේ අලියෙක් කළ මෙවැනිම පළි ගැනීමක් පිළිබඳවය. මෙයට ඇලලේතොට ගෙදර හැටවයස් යාග ප්‍රධානියාද ඉතා දක්ෂ හේන් ගොවියෙක් විය. ඔහු තවත් ගැමියන් දෙදෙනෙක් සමග නුවර හේන් යායේ හේනක් කෙටුවේය.

හේනට යන එන ගමනේදී මොවුන්ට අලි ගැවෙසෙන වනපෙත මැදින් යන්නට එන්නට සිදුවිය. විශේෂයෙන්ම ඔවුන් බියවූයේ මේ පාරේ නිතර බොහෝදෙනාට හමුවන තනිඅලියාටය. තනිඅලියා සාමාන්‍යයෙන් භයානකය. රංචුවකට වඩා තනිඅලියා පහර දීමට පෙළෙඹෙන බව ගැමියන්ගේ විශ්වාසයයි.

එදත් සවස් භාගයේ හේනේ වැඩ හමාරකොට කිහිපදෙනෙක් ඉතාපරිස්සමින් නිවස්බලා වනපෙත මැදින් පා ගමනක යෙදුනහ. වැඩිදුරක් යන්නටපෙර තනියා බෙබියාව වැවේ සිට වැව්බැම්මට මත විය. 'තනියා'යි කාටත් එකවරම කියැවිණි.

පැමිණී පිණිස සිසිකඩ විසිරුණෝය. පණ බේරා ගැනීම සඳහා හිසහැරුණු අතට දුව පැන ගත්තේය. ඇල්ලේකොටුවගෙදර හැට වයස් ගෘහ ප්‍රධානියාට තරුණ වියේදි මෙන් හපන්කම් කරන්නට ශක්තියක් නැත. විදුලි වේගයෙන් ඉදිරියට පැමිණි හස්තිරාජයා හමුවේ ගැමියා අසරණ විය. හොඬවැල අතරෙහි පටලවාගත් ගැමියා මළකඳක් වන්නට ගතවූයේ විනාඩි කිහිපයක් පමණි. ඉන් අනතුරුව හස්තිරාජයා මළසිරුර කොළ අතු වලින් වසා දැම්මේය.

සෙසු මිත්‍රයෝ ගස්කොළන්වලට නැග සැගවී බල සටියහ. ක්‍රමයෙන් ඒ ස්ථනවලින් පිට වී අඳුර රජයන්ට පෙර නිවසට යන්නට අවස්ථාවක් ලැබුණෝය. මළසිරුර තනිකර දමානොගිය අලියා ඒ මළසිරුර අබියසට වී බලා සිටින්නට විය.

මිනිමරු තනියෝ පිළිබඳ පුවත පොලිසිය ටද සැල වුනේය. අලියා වනපෙතට රිංගා ගත්තේ පොලිසීයේ මෙවලම්වලට තිබෙන බිය නිසා විය යුතුය.

නෑ හිතවතුන් එක් වී මළසිරුර භූමදනය කරන ලදී. අලියා අනතුර සිදු කළ ස්ථානයේ භූමදනය ඉටුකරන ස්ථානයක් වන අතර සැතැපුම් දෙකහමාරක් තරම් පරතරයක් ඇත්තේය. අරුම පුදුම පළිගැනීමක් 'තනියා' විසින් කරණු ලැබුයේ භූමදනය කල දින රාත්‍රියේදිය.

තනියා එදින රාත්‍රියේ වනපෙත ගෙවාගෙන ගැමියාගේ සොහොන කරා පැමිණියේය. කොහොමත් කර තිබුණු සියලු සැරසිලි හස්තියා සීසී කඩ විසිකර දැමුවේය. මලකඳ තැන්පත්කර තිබුණු ස්ථානයේ පස්පවා අවුස්සා දමන ලදී.

හිරු එළිය මහපොළොව මත පතිත වන්නට පෙර වනපෙත ටරිංගා ගැනීමට 'තනියාට' අවශ්‍ය නොවීය. කුරුලු හඬ පැතිරෙද්දී හිරු පායන කලද 'තනියා' තාමත් සොහෙන් බිමේය. තනියා සොහෙනට පැමිණ ප්‍රකාශ කලේ තමා අතින් සිදුවූ වරදට කණගාටුවද ? එසේත් නැත්නම් තවදුරටත් පලි ගැනීමක්ද ?

හේන් රකින ගැමියන්ගේ අතවරයන්ගෙන් දැඩි ලෙස පීඩාවිදීමකට මේ තනිඅලියා යම්දිනෙක ගොදුරුවන්නට ඇතැයි අනුමාන කිරීමට පුලුවන. තනිඅලියා සොහොනට පැමිණියේ පලි ගැනීමක් සඳහා නම් එය අලියාගේ කුරිරු කම පිළිබඳ කතාවකි. තනියා පැමිණියේ තමා කළ වරදට සමාව අයැද කම්පාවීමට නම් එය අලිපරපුරේ ගෞරවය සුරැකීමට තනියා ගත් පියවරකි.

**(මැදිරුගිරියේ ඩබ්ලිව්. ජී. චන්ද්‍රසිරි වික්‍රගේ මහතා කළ ප්‍රකාශ අනුව මේ කතාව ලියන ලදී.)**